# සාමාන්‍ය සමයේ විසිපස්වන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

එස්රාගේ පොතෙන් ගත් පාඨයෙකි.

එස්රා 6 : 7-8, 14-20

"ඔව්හු දේව මාළිගාව සාදා නිමකර පාස්කු මංගල්‍යය පැවැත්වූහ."

දාරියුස් රජ මේ නියෝගය නිකුත් කළේය. "දෙවියන් වහන්සේගේ මේ මාළිගාවේ වැඩ කරගෙන යන පිණිස ජුදෙව්වරුන්ගේ දිශාපතියාට ද ජුදෙව්වරුන්ගේ ප්‍රජා මූලිකයන්ට ද ඉඩ හරින්න. දෙවියන් වහන්සේගේ මේ මාළිගාව කලින් තිබුණු ස්ථානයෙහි ඔව්හු ගොඩනගත්වා. ඇරත් දෙවියන් වහන්සේගේ මේ මාළිගාව ගොඩ නැගීම පිණිස ඔබ ජුදෙව්වරුන්ගේ මේ ප්‍රජා මූලිකයන්ට කළ යුතු දේ ගැන මම මෙසේ නියෝගයක් කරමි. වැඩට අවහිරයක් නොවන පිණිස රාජ භාණ්ඩාගාරයේ දෙයින් එනම්, යුප්‍රටීස් ගඟින් එගොඩ පෙදෙසින් ලැබෙන බදු ආදායමෙන් නොපමාව මුළු වියදම දිය යුතුය."

ජුදෙව්වරුන්ගේ ප්‍රජා මූලිකයෝ ද දිවැසිවර හග්ගයිගේත් ඉද්දෝගේ පුත් ශෙකරියාගේත් දිවැස් වැකියෙන් උනන්දු වී දේව මාළිගාව ගොඩනැඟීම සාර්ථක ලෙස කරගෙන ගියහ. ඔව්හු ඉශ්රායෙල් හි දෙවියන් වහන්සේගේ ආඥාවේ හැටියටත්, සයිරස්ගේ ද දාරියුස්ගේ ද පර්සියාවේ රජ වූ අර්තක්ෂස්තාගේ ද නියෝගයේ හැටියටත් මාළිගාව ගොඩනගා නිම කළෝය. දාරියුස් රජුගේ රාජ්‍ය කාලයේ හය වන අවුරුද්දේ අදාර් මාසයේ තුන්වන දින මේ මාළිගාව සාදා නිම කරන ලදි. ඉශ්රායෙල් සෙනඟ වන පූජකවරු ද ලෙවීවරු ද විප්‍රවාසයෙන් මිදී පැමිණි සෙසු අය ද

දෙවියන් වහන්සේගේ මාලිගාව කැප කිරීමේ උත්සවය මහා හරසරින් පැවැත්වූහ. තවද, ඔව්හු දෙවියන් වහන්සේගේ මාලිගාව කැප කිරීමේ දී ගොනුන් සියයක් ද බැටළුවන් දෙසීයක් ද බැටළු පැටවුන් හාර සියයක් ද ඉශ්රායෙල්වරුන්ගේ ගෝත්‍රවල ගණන ලෙස සියලු ඉශ්රායෙල්වරුන් උදෙසා පාප පූජාවක් වශයෙන් එළුවවන් දොළොස් දෙනෙකු ද ඔප්පු කළෝය. මෝසෙස්ගේ ව්‍යවස්ථා පොතේ නියම කර තිබෙන ප්‍රකාරයට ඔව්හු තමන්ගේ පූජකයන් ඔවුන්ගේ කොට්ඨාශවල හැටියටත්, ලෙව්වරුන් ඔවුන්ගේ පංතිවල හැටියටත් ජෙරුසලමෙහි දෙවියන් වහන්සේගේ මාලිගාවේ සේවය පිණිස පත් කළෝය.

විප්‍රවාසයෙන් මිදී ආ අය පළමු වන මාසයේ දහහතර වන දින පාස්කු මංගල්‍යය පැවැත්වූහ. පූජකවරු ද ලෙව්වරු ද එක් කෙනෙකු වත් නැර සියලු දෙන ම පිරිසිදු වී සිටියෝය. ඔව්හු සියල්ලෝ පිරිසිදු ව සිට විප්‍රවාසයෙන් මිදී ආ සියල්ලන් උදෙසා ද පූජකයන් වූ තමන්ගේ සහෝදරයන් උදෙසා ද තමන් ම උදෙසා ද පාස්කු මංගලයය සඳහා බැටළු පැටවුන් මැරූහ.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 122 : 1-5

පිළිතුර: සමිඳුන් මැදුරට ප්‍රීතියෙන් පා නගමු.

ගීය:

"දෙව් මැදුරට යමු" යි ඔවුන් මට කී විට මම ප්‍රීතියෙන් පිනා ගියෙමි.

එම්බා ජෙරුසලම! අපේ දෙපා තිගේ වාසල ඇතුළේ තබා තිබේ.

එම්බා ජෙරුසලම! මැනවින් සාදා නිම කළ නුවරක් මෙන් තී ගොඩනගන ලද්දිය.

ඉශ්රායෙල් සෙනඟට නියම කළ ලෙස ගෝත්‍රයෝ සමිඳුන්ගේ ගෝත්‍රයෝ, එතුමන් නමට තුති දෙන පිණිස මෙම නගරය වෙත පැමිණෙති.

මන්ද, සිංහාසනය, එනම්, දාවිත්ගේ සෙනඟ විනිශ්චය කරන පිණිස එහි පිහිටා තිබේ.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
මම සමිඳුන්ගේ උපකාරය උදක්ම බලා සිටිමි.
එතුමන්ගේ වචනය කෙරෙහි බලාපොරොත්තුව තබමි.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේගේ වචනය අසා එය පිළිපදින්නෝ භාග්‍යවන්තයෝ ය.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමන්ගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 8: 19-21

"මාගේ මෑණියෝත් මාගේ සහෝදරයෝත් නම් දේව වචනය අසා එය පිළිපදින්නෝ ය.."

ජේසුස් වහන්සේගේ මෑණියෝ ද සහෝදරයෝ ද උන්වහන්සේ වෙත ආහ. එහෙත් සමූහයා නිසා උන්වහන්සේට ළංවන්නට ඔවුන්ට නොහැකි විය. එවිට "ඔබේ මෑණියෝ ද සෝදරයෝ ද ඔබ දකිනු රිසියෙන් පිටත සිටිති"යි උන්වහන්සේට දන්වනු ලැබිය. එහෙත් උන්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් "මාගේ මෑණියෝත් මාගේ සහෝදරයෝත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා එය පිළිපදින්නෝ වෙති"යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.